# පරීක්ෂක වාර්තාව

**අදියර II විභාගය - 2021 ජූලි**

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

---

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මුළු ලකුණු 25ක් ලබාගත හැකි වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 14 කින් මෙම ප්‍රශ්නය සමන්විත විය.

ව්‍යාපාර නීතිය පිළිබඳ සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය කෙරෙන උප ප්‍රශ්න ඒවා තුළ ඇතුලත් විය. අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබුණේය.

ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ප්‍රශ්නය සඳහා වෙන්කර තිබූ මුළු ලකුණු වලින් අඩකට වඩා උපයාගෙන තිබුණි.

ප්‍රශ්න අංක **1.11, 1.12** සහ **1.13** ට නිවැරදිව උත්තර ලිවීමට අයදුම්කරුවන් අතුරින් සෑහෙන ගණනක් අසමත් වී තිබුණ බව දක්නා ලදී. සමහර අයදුම්කරුවන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මූලිකාංග නිවැරදිව හඳුනාගෙන තිබුණේ නැත. ඔවුන් භාණ්ඩ විකිණීමේ ව්‍යංග කොන්දේසි පිළිබඳව ලියා තිබුණේය. ඔවුනට, මූල්‍ය බුද්ධි ඒකකය ගැන සහ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 5 වන වගන්තිය පිළිබඳ දැනුමක් තිබී නැත.

**A කොටස** සඳහා ඉහළ ලකුණු උපයා ගැනීමට නම් අයදුම්කරුවන්ට සිවිල් නීතිය, භාණ්ඩ විකිණීමේ ආඥා පනත, ව්‍යවස්ථා පිළිබඳ නීති, ගිවිසුම් පිළිබඳ නීති, ජාත්‍යන්තර නීති, නියෝජ්‍යත්ව පිළිබඳ නීති, විනිමය බිල්පත් පිළිබඳ නීති හා ගනුදෙනු කළ හැකි ලියවිලි පිළිබඳ නීති ගැන හොඳ දැනුමක් ලබා තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් නියෝජ්‍යත්ව නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ නමුත් අදාල නොවන උත්තර ගණනක් සපයා තිබුණේය. බොහෝ අයදුම්කරුවන් **(a) කොටසට** නිවැරදි උත්තර සපයා තිබුණි. **(a) කොටසින්** අවශ්‍ය කර තිබුණේ **සරත්ට** එරෙහිව සමාගමේ නෛතික අයිතිවාසිකම් විමසීමට ලක් කිරීමය. බොහෝ අයදුම්කරුවන් **(b) කොටසට** වැරදි උත්තර සපයා තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බහුතරය සඳහන් කර තිබුණේ **සීමාසහිත සුදු ලූණු (පුද්ගලික) සමාගම** වැඩි මිලට ලූණු විකිණීම පිළිබඳ වගකිව යුතු බවය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් රක්ෂණ නීතිය පිළිබඳ දැනුම, විශේෂ වශයෙන් "රක්ෂණය සඳහා ආසන්නතම හේතුව" පිළිබඳ මූලධර්මය ගැන දැනුවත්බව පරීක්ෂා කර ඇත. මෙය රක්ෂණ නීතියට අදාල තරමක් සරල ප්‍රශ්නයකි. බොහෝ අයදුම්කරුවන් මෙයට උත්තර ලියා තිබූ අතර ඒවා නිවැරදි විය. ඔවුන්ගෙන් බොහොමයක් රක්ෂණයේ ආසන්නතම හේතුව ගැන සඳහන් කර තිබුණේය. එහෙත්, සමහර අයදුම්කරුවන් **රාජා** විසින් ලබාගත් ජීවිත රක්ෂණයෙන් කෝවිඩ්-19 ආවරණය නොවන බව සඳහන් කර තිබුණේ නැත. බොහෝ අයදුම්කරුවන් **(b) කොටසට** නිවැරදි උත්තර සපයා තිබුණි. **සීතාට, රාජාගේ** කලත්‍රයා වශයෙන් රාජාගේ ජීවිතය පිළිබඳ රක්ෂණ හිමිකමක් ඇති බව අයදුම්කරුවන් සඳහන් කර තිබුණේය. තවද, මෝටර් රථ අනතුරකින් එම අභාවය සිදුවූයේ නම්, වන්දි ලබා ගැනීමට **සීතාට** හැකියාව තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය තරමක් සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

මෙය සමාගම් පනත හා සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි. බොහොමයක් අයදුම්කරුවන් එයට උත්තර සපයා තිබූ අතර **(b) කොටසට** නිවැරදි උත්තර ලියා තිබුණි. **(a) කොටසට** නිවැරදි උත්තර සපයා තිබුණේ අයදුම්කරුවන් සුළු ගණනකි. ඔවුන්ට සාංගමික ව්‍යවස්ථාවලිය පිළිබඳ දැනුමක් නොමැතිබව පෙනුණි. විශේෂයෙන්, සමාගමේ අරමුණු පිළිබඳ වගන්ති ඇතුළත් වන්නේ සාංගමික ව්‍යවස්ථාවලියේ බව ඔවුන් නොදැන සිටියහ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 05

මෙය කම්කරු නීතියට සම්බන්ධ තරමක් සරල ප්‍රශ්නයකි. දී තිබූ එක් එක් අවස්ථා යටතේ "සේවා නියුක්තික" සංකල්පය හඳුනාදැක්වීම අවශ්‍ය විය. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සපයා තිබූ අතර **(a)** සහ **(b) කොටස්වලට** නිවැරදි උත්තර ලියා තිබුණි. අයදුම්කරුවන් සුළු ගණනක් **(a) කොටසට** නිවැරදි උත්තර ලිවීමට අසමත් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

**(a)** මෙම කොටස අන්තර්ජාතික වෙළඳාම මත පදනම් වී ඇත. අන්තර්ජාතික වෙළඳාමේ ගෙවීම් ක්‍රමයක් ලෙස ණයවර ලිපියක කාර්යභාරය පැහැදිලි කිරීම අවශ්‍ය කර තිබුණි. සමහර අයදුම්කරුවන්ට ණයවර ලිපි ගැන දැනුමක් තිබූ නමුත්, ණයවර ලිපියක කාර්යභාරය නිවැරදි ලෙස පැහැදිලි කිරීමට අසමත් විය.

**(b)** මෙම කොටස බුද්ධිමය දේපල මත පදනම්ව තිබුණි. අයදුම්කරුවන් බොහෝදෙනෙකු මෙම කොටසට නිවැරදි උත්තර සපයා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## C කොටස

### ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විතය.

**(A) මෙම කොටස ගිවිසුම් නීතිය මත පදනම්ව ඇත.**

**(a)** බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා ඇත. පිළිවෙලින් **රීනා** සහ **ටෝනි** සහ රෝහල් සමාගම අතර වලංගු ගිවිසුම් ඇති බව ඔවුන් නිවැරදිව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, තවත් සමහර අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ **ටෝනි** හට අත්තිකාරම් ගෙවා නොතිබූ නිසා රෝහල් සමාගම හා **ටෝනි** අතර වලංගු ගිවිසුමක් නොමැති බවය.

**(b)** බොහොමයක් අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ, ගිවිසුම කඩකිරීමේ පදනම මත **රීනා** සහ **ටෝනිට** එරෙහිව නඩු පවරා වන්දි ඉල්ලා සිටීමට රෝහල් සමාගමට හැකි බවය. ඒ අනුව ඔවුන්ට සම්පූර්ණ ලකුණු උපයාගත හැකිවිය.

**(c)** සැලකිය යුතු අයදුම්කරුවන් ගණනක් සඳහන් කර තිබුණේ ව්‍යර්ථ වීමෙන් ගිවිසුම අවසන් වූ බවය. තවද ඔවුන් සඳහන් කර තිබුණේ ගිවිසුම අවසන් වීම **රීනාගේ** පාලනයෙන් තොර කරුණක් වූ රජයේ මැදිහත් වීම හා වෙනත් කරුණු නිසා සිදු වූවක් බවය. ඒ අනුව, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට මේ කොටස සඳහා හොඳ ලකුණු උපයාගත හැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

**(B) මෙම කොටස පදනම් වී ඇත්තේ භාණ්ඩ විකිණීමේ ආඥා පනත මතය.**

(a) බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට නිවැරදි උත්තර සපයා තිබුණේය. කාර් රථයට ගෙවන ලද සම්පූර්ණ මුදල් ප්‍රමාණය **කමල්ට** ඉල්ලා සිටිය හැකි බව බොහොමයක් අයදුම්කරුවන් සඳහන්කර තිබුණේය. භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ (13) (1) වගන්තිය මෙම කරුණේදී අදාල වන හෙයින්, එයට අනුකූලව, විකිණීමක දී, දේපල හුවමාරුවන අවස්ථාවේ දී භාණ්ඩ විකිණීමේ අයිතිය භාණ්ඩ විකුණුම්කරුට තිබිය යුතුව ඇත.

(b) භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ නොගෙවන ලද විකුණුම්කරුවෙකුට "භාණ්ඩවලට එරෙහිව" ඇති ප්‍රතිකර්ම පිළිබඳව මෙම කොටසින් පරීක්ෂා කර ඇත. මෙම කොටසට ද බොහෝ අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක මට්ටමක විය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන් ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණුඃ</u>**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යන පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * -